දුරකථන තිබීම තාක්ෂණයේ දියුණුව සමගම සමාජ සම්බන්ධතා හා ක්‍රියාකාරකම් පුළුල් වී යාම ද පෙන්නුම් කරයි.

කෙසේ නමුදු පරිගණකයට යොමු වන වැඩිහිටියන් මෙන්ම දරුවන් ද කල් නොයවාම සිය මුළු ආත්මයම ඊට කැප කරන්නට යොමු වන අයුරු දැකගත හැකිය. පෙර කී පරිදි, කාටූන මගින් නිර්මාණ කරුවන් කියා පාන්නේ ද පරිගණක විද්‍යාව දියුණු වීම හේතු කොට ගෙන මිනිස් ජීවිත පරිගණකය විසින් සින්න කරගනු ලැබ ඇති නිසා දෙමාපිය . දරු අන්‍යොන්‍ය සම්බන්ධතා පවා ලිහිල් වී ගොස් ඇති බවයි. මෙයට ප්‍රධාන හේතුව ලෙස කිව හැක්කේ තාක්ෂණික දියුණුවේ වරද හෝ එහි ප්‍රතිඵල ලෙස ලැබී ඇති පරිගණක හා ජංගම දුරකථන වැනි භාණ්ඩවල වරද හෝ නොව මිනිස් ජීවිතවල මූලික අවශ්‍යතා බිල්ලට දෙමින් එම යන්ත්‍රවල වහලුන් බවට පත් වීමට සමාජය යොමු වීමයි.

මිනිසා හුදෙකලා සත්වයෙක් නොවේය යන්න පිළිගත් සත්‍යයකි. පවුල තුළ අන්‍යොන්‍ය සම්බන්ධතා, ආදරය, සෙනෙහස තිබීම සාර්ථක හා ප්‍රීතිමත් ජීවිතයකට අත්‍යවශ්‍යය. දවසේ වැඩ අවසන් වී ගෙදර එන සැමියා පුවත්පත ද අතැතිව රූපවාහිනිය ඉදිරියේ අසුන් ගෙන කාලය ගත කරයි නම් නිවස තුළ සැබෑ සතුටක් ආදරයක්, වගකීමක් ඇති විය හැකිද? තාත්තා සාලයේ සිට පරිගණකයෙන් ව්‍යාපාර කටයුත්තකට යොමු වී සිටියදී මව තම පවුලේ අය සඳහා රසවත් ආහාර වේලක් සැකසීමට මුළුතැන්ගෙයි සිට පරිගණකයක් භාවිත කරමින් වෙබ් අඩවියකට පිවිස සිය අත්හදාබැලීම කරයි නම්, දරුවන් ද තමතමන්ගේ කාමරවලට කොටු වී තමන් කැමති දර්ශන නැරඹීමට හෝ වෙනත් විනෝදකාමී ක්‍රියාවක යෙදෙයි නම් එවැනි නිවසක ජීවත් වන පවුල නූතන තාක්ෂණය නමැති රකුසකු විසින් බිල්ලට ගෙන ඇති බවක් කිව හැකිය. එහෙත් නූතන තාක්ෂණය හා එමගින් අප ලබා ඇති දියුණු තාක්ෂණික මෙවලම් යහපත් ලෙස, අවධානයෙන් යුතුව පරිහරණය කරමින් සොඳුරු පවුලක් තුළ දිවිගෙවීමට කිසිදු බාධාවක් නැත. වරද ඇත්තේ භාණ්ඩයේ හෝ එමගින් ලැබෙන පහසුකම්වල නොව යථා පරිදි ඒවා අවශ්‍ය ප්‍රමාණයට, පිළිවෙළට යහපාලනයකින් යුතුව පරිහරණය නොකරන අය අතයි.

අද මහ මග ගමන් කරන විටදී හෝ, බස් නැවතුම් පළකදී හෝ විශේෂයෙන් ගතහොත් ගුවන්තොටුපළකදී හෝ අපට දැකගන්නට ලැබෙන්නේ තනි ගැහැනු මිනිස්සුය. තමන් අත ඇති ස්මාට් ජංගම දුරකථනය දෙස දෑස් යොමාගෙන, අවට කිසිවකුත් සිටින බවක්වත් නොදැන හෝ නොසිතා, ඇඟිලි මෙහෙයවමින් නොයෙක් තොරතුරු සොයන, දන්වන හා එමගින් හුදෙකලා ආස්වාදයක් විඳින තනි තනිව ජීවත් වන පුද්ගලයෝය.

මිනිස් ශිෂ්ටාචාරය දිනෙන් දින දියුණු වෙද්දී මානව සම්බන්ධතා මෙලෙස ශීඝ්‍රයෙන් බිඳ වැටීමක් සතුටින් භාරගත හැකිද යන්න ප්‍රශ්නයකි. ජීවිතයට අත්‍යවශ්‍ය වනුයේ ආහාර පාන, නිවාස හා රැකවරණ, ඇඳුම් පැළැඳුම්, යාන වාහන පමණක් නොවේ. ආදරය, සෙනෙහස, එකිනෙකා හඳුනාගැනීම, අන්තර්.ක්‍රියාකාරකම් මෙන්ම සතුට, ආස්වාදය, ආරක්ෂාව යන මේ සියල්ල මිනිසාට අත්‍යවශ්‍ය දේය. ඇතැම් විට මහමග තනිව ගමන් කරන යෞවනියක් අවට පරිසරය ගැන කිසිදු අවධානයකින් තොරව, ජංගම දුරකථනයකින් කෙනකු සමග දීර්ඝ කථා බහකට යොමු වී යද්දී සොර සතුරකුට හෝ සාහසිකයකු-ට කිසියම් අතවරයක් කිරීමට හෝ, කිසිවක් සොරාගෙන, උදුරාගෙන යාමට හෝ ඉඩකඩ ඇත. පාසල් ශිෂ්‍යශිෂ්‍යාවන්, විශේෂයෙන්ම යෞවන වියේ පසු වන ශිෂ්‍යාවක් ජංගම දුරකථන මගින් නොදැනුවත්වම යොමු වන සම්බන්ධතා නිසා අවසානයේදී සිය දිවි හානි කරගත් අවස්ථා ගැන ද උදාහරණ අල්ප නොවේ.

මෙවන් තත්වයකදී ශ්‍රී ලාංකික සංස්කෘතික පසුබිම වැනි පරිසරයක දෙමාපිය, ගුරුවර, වැඩිහිටියන් වෙත පැවරුණ වගකීම් සම්භාරයක් වෙයි. විශ්ව සමාජය තමන්ට අවශ්‍ය අතට යොමු කරවන්නට තැත් කිරීමේ අසාර්ථක ප්‍රයත්නයක යෙදෙනවාට වඩා තම නිවස තුළ පවුල තුළ දූදරුවන් හැකි තරමින් හෝ යහමගට ගනිමින් තාක්ෂණික දියුණුවේ යහපත් පැත්තට ඔවුන් යොමු කරවාගත හැකි නම් එය භාග්‍යයකි. විශ්ව සමාජය එකට සම්බන්ධ කරමින් යළි වෙන් කර හුදෙකලා කරවන අයහපත් මාධ්‍යයක් බවට තාක්ෂණික දියුණුව පත් නොවන්නට අපගේ දායකත්වය අත්‍යවශ්‍යය.




